# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1878/9 - 2014 සැප්තැම්බර් මස 01 වැනි සඳුදා - 2014.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/22/69/2009

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.07.20 වැනි දිනැති හා අංක 1715/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.07.15 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කන්තලේ, අග්‍රබෝධි මාවත, අංක 383 හි පදිංචි ආර්. එම්. එන්. රාජපක්ෂ මයා / කන්තලේ, ප්‍රියන්ත මාවත, අංක 43/50 හි පදිංචි එන්. ජී. ප්‍රේමසිරි මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුල පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.07.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල් යූ. විජයවීර,
*වැ.බ.* කම්කරු කොමසාරිස්.

2014 අගෝස්තු මස 15 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/22/69/2009

කාර්මික අධිකරණයේ දී ය.

01. ආර්. එම්. එන්. රාජපක්ෂ මහතා,
අංක 383,
අග්‍රබෝධි මාවත,
කන්තලේ.

02. එන්. ජී. ප්‍රේමසිරි මහතා,
අංක 43/50,
ප්‍රියන්ත මාවත,
කන්තලේ.

*ඉල්ලුම්කරුවන්*

නඩු අංකය : ඒ/3394 — එදිරිව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුල පාර,
කොළඹ 05.

*වගඋත්තරකරු*

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශෙෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2011.07.15 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

2011.07.15 වැනි දිනැතිව මා වෙත බේරුම්කරණය සඳහා යොමු කර ඇති ආරාවුල වන්නේ "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ

පාලනය වන කන්තලේ ඩිපෝවේ සේවය කරමින් සිටියදී 2007.04.12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ තහනම් කරනු ලැබූ එහි වැඩ නායක ආර්. එම්. එන්. රාජපක්ෂ හා රියදුරු එන්. ජී. ප්‍රේමසිරි යන අය සම්බන්ධයෙන් එම මණ්ඩලයේ නැගෙනහිර ප්‍රාදේශිකය - කල්මුනේ අභියාචනා මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ 2007.11.23 වැනි දිනැති අභියාචනා නියෝගය ප්‍රකාරව ඔහුන්ගේ වැඩ තහනම් කර තිබූ කාල සීමාව සඳහා හිඟ වේතන ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ".

ආර්. එම්. එන්. රාජපක්ෂ යන අයද 2007.04.01 වැනි දිනැති ලිපිය මගින් 2007.04.12 වැනි දින සිට සේවය තහනමට ලක් කර ඇත. ඉන් අනතුරුව 2007.04.26 වැනි දිනැති චෝදනා පත්‍රය අනුව චෝදනා ගොනු කර, විනය පරීක්ෂණයක් පවත්වා 2007.08.02 වැනි දින විනය නියෝගය නිකුත් කර, ඒ අනුව සියළු චෝදනාවන්ට වැරදිකරු බවට නිගමනය කර සේවය මාස 02 කට අත්හිටුවමින් හා තරයේ අවවාද කර දඬුවම් ලබා දී ඇත. මෙම නිගමනයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, 2007.11.23 වැනි දිනැති අභියාචනා නියෝගය මගින් දී ඇති දඬුවම් ඉවත් කර සියළු චෝදනාවලින් නිදහස් කර ඇත.

එසේ අභියාචන නියෝගය මගින් ඔවුන් සියළු චෝදනාවන්ගෙන් නිදහස් වී ඇති බැවින් ඔවුන් ඉල්ලා සිටින්නේ ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවේ 6 - 1 වගන්තිය ප්‍රකාර ඔවුන්ව සේවා තහනමට ලක්කර සිටි කාලයට පසු වේතන ලබා දෙන ලෙසය.

ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවේ සේවා තහනම් කිරීම සම්බන්ධව ව්‍යවස්ථා අංක 06 යටතේ සඳහන් වන අතර, 6 - 1 වගන්තිය යටතේ අනිකුත් කරුණු අතර මෙසේ සඳහන් ව ඇත.

6 - 1 "................................ එනමුත් චූදිත සේවකයා මුළුමනින්ම චෝදනාවලින් නිදහස් වුවහොත් නියමිත බලධරයා විසින් සේවකයා වහාම සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීමටත්, **සේවය තහනම් කර සිටි කාලය තුලදී නොගෙවන ලද සම්පූර්ණ වැටුප ගෙවීමටත් නියෝග කල යුතුය.**"

ඉහත සඳහන් වගන්තියට අනුව චූදිත සේවක මුළුමනින්ම සියළු චෝදනාවලින් නිදහස් වුවහොත් සේවය තහනම් කර සිටි කාලය තුලදී නොගෙවන ලද සම්පූර්ණ වැටුප ගෙවිය යුතු බව පැහැදිලි ලෙස සටහන්ව ඇත.

එසේ තිබියදී ආයතනය විසින් එකී මුදල ගෙවීම ප්‍රතික්ෂේප කරනු ලබන්නේ කුමන හේතුවක් නිසාද යන්න සලකා බැලිය යුතුය.

වගඋත්තරකාර ආයතනයේ ස්ථාවරය වන්නේ, මොවුන් සම්පූර්ණයෙන් චෝදනාවලින් නිදහස් වී ඇත්තේ, මුල් විනය නියෝගයෙන් නොව අභියාචනා නියෝගයෙන් බවත්, අභියාචනාකරුට වේතන ලබාදීම සම්බන්ධයෙන් විනය ව්‍යවස්ථාවේ අංක 18 වගන්තිය යටතේ කටයුතු කල යුතු බවත්, අංක 6 - 1 වගන්තිය යටතේ ඉල්ලීම් කිරීමට මොවුන්ට හිමිකමක් නොමැති බවත්, මෙම ඉල්ලුම්කරුවන්ට ප්‍රතිලාභ හිමි වනුයේ 18-1 වගන්තිය යටතේ පමණක් බවත් ය.

18 - 1 වගන්තියේ මෙසේ සඳහන් වේ.

"අභියාචනය සාර්ථක වුවහොත් අභියාචනා විභාගයට පෙනී සිටීම සඳහා සේවයට පැමිණීමට නොහැකි වූ කාලය සේවයේ යෙදුණු කාලයක් ලෙස සලකනු ලබන අතර, සේවයට නොපැමිණි එම කාලය හෝ දිනය හෝ දිනයන් සඳහා අභියාචනාකරුට පඩිය හෝ වේතනය ගෙවනු ලැබේ".

18 - 2 අසාර්ථක වූ අභියාචනයක් සම්බන්ධයෙන් කිසිම ගෙවීමක් කරනු නොලැබේ.

වගඋත්තරකරුගේ ස්ථාවරයට අනුව මෙම ඉල්ලුම්කරුවන් වෙත 6 -1 වගන්තිය ප්‍රකාර සේවා තහනමට ලක්කර සිටි කාලය සඳහා හිමි පසු වේතන ලබා නොදීමට ඇති එකම හේතුව වන්නේ ඔවුන් මූලික විනය විභාගයේදීම සියළු චෝදනාවන්ගෙන් නිවැරදිකරුවන් බවට පත් නොවී අභියාචනා නියෝගයෙන් සියළු චෝදනාවන්ගෙන් නිදහස්වීම බව ඉතාම පැහැදිලිය.

ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවට අනුව මූලික විනය නියෝගයකින් අතෘප්තියට පත් අයෙකුට එකී නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව යම් අයෙකුට විනය නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ලබා දී ඇති බව පැහැදිලි කරුණකි. එමෙන්ම විනය නියෝගයකින් යම් පුද්ගලයෙකු චෝදනා එකකට හෝ කිහිපයකට නැතහොත් සියළුම චෝදනාවලට වැරදිකරු බවට නියෝග කර ඇති කල එයට එරෙහිව කරන ලද අභියාචනයකදී අභියාචනා නියෝගයකින් එකී විනය නියෝගය ඉවත් කර සියළුම චෝදනාවලින් චූදිතයකු නිදහස් කර දෙනු ලබන අභියාචන නියෝගයකින් සිදු වනු ලබන්නේ පැහැදිලිවම චූදිත වැරදිකරු වූ තත්ත්වයෙන් නිවැරදිකරු බවට පත්වීමයි. එනම්, එම පුද්ගලයාගේ තත්ත්වය (status ante) නැවත තිබූ තත්ත්වයට පත් වන බවයි.

එය මෙසේ තිබියදී විනය ව්‍යවස්ථාවේ 6 - 1 වගන්තිය සලකා බැලීමේදී අභියාචනයකින් සහන ලැබූ සම්පූර්ණයෙන්ම චෝදනාවලින් නිදහස් වූ අයෙකුට එම වගන්තිය යටතේ සහන ලබා ගත නොහැක යන්න සඳහන් කර නැත. එමෙන්ම 6 -1 වගන්තිය යටතේ සඳහන් සහන සේවකයෙකුට හිමි වන්නේ මූලික විනය නියෝගයෙන් නිදහස් වුවහොත් පමණය යන්නද සඳහන් නැත.

තවද 18 - 1 වගන්තිය සලකා බැලීමේදී අභියාචන නියෝගයෙන් සම්පූර්ණයෙන් නිදහස් වූ අයෙකුට 6 - 1 වගන්තිය යටතේ සහන ඉල්ලා සිටීමට නොහැක යනුවෙන් සඳහන් වී නොමැත.

එමෙන්ම වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති විත්ති වාචකය සාධාරනීයකරණය කිරීම සඳහා පිළිගත හැකි තර්කයක් හෝ කරුණු ඉදිරිපත් කර නොමැත. ඉදිරිපත් වී ඇති කරුණු සලකා බැලීමේදී මූලික විනය විභාගයේදී සියළුම චෝදනාවලින් චූදිතයකු නිදහස් වූයේ නම් විනය ව්‍යවස්ථාවේ 6 - 1 වගන්තිය යටතේ එකී තැනැත්තාට සේවය තහනම්ව සිටි කාලය සඳහා පසු වේතන ලබා ගැනීමට අයිතියක් තිබෙන බව වගඋත්තරකරු පිළිගනී.

මූලික විනය නියෝගයකින් අතෘප්තියට පත් අයෙකු අභියාචනයකින් බලාපොරොත්තු වන්නේ කුමක් ද ? මූලික විනය නියෝගයෙන් සියළු චෝදනාවලට වැරදිකරු වූ අයෙකුට එකී මූලික විනය නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දී එයින් අපේක්ෂා කරන්නේ කුමක් ද ? අභියාචනා නියෝගයකින් සම්පූර්ණයෙන් සියළු චෝදනාවලින් නිදහස් වූ පුද්ගලයෙකු සම්පූර්ණ වශයෙන්ම නිවැරදිකරුවකු බවට පත්වන බව ඕනෑම සාධාරණ බුද්ධියකින් යුතු පුද්ගලයෙකුට තේරුම් යනවාට කිසිදු සැකයක් නැත. තවද ශ්‍රී ලංගම විසින් පවත්වා ගෙන යනු ලබන විනය පටිපාටිය ආයතනය මගින්ම සකස් කරන ලද්දක් මිස ව්‍යවස්ථාපිත ලේඛනයක් නොවේ.

වගඋත්තරකාර ආයතනය කුමන පදනමක් මත මෙවන් ස්ථාවරයකට පැමිණ කටයුතු කර ඇතිද යන්න තහවුරු කිරීම සඳහා පිළිගත හැකි කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නැත. වගඋත්තරකරුගේ මෙම ක්‍රියා කලාපය ස්වභාවික යුක්ති ධර්මයේ සිද්ධාන්තයන්ට පටහැනි බව මගේ විශ්වාසයයි.

ඉහත සඳහන් සියළු කරුණු සමස්තයක් ලෙස ගෙන විශ්ලේෂනය කර බැලීමේදී වගඋත්තරකරුවන් විසින් ගෙන ඇති ස්ථාවරය පැහැදිලි කිරීමට පිළිගත හැකි කරුණු ඉදිරිපත් කර නොමැති නිසාත්, එකී නිගමනය ස්වභාවික යුක්ති ධර්මයේ සිද්ධාන්තවලට පටහැනි නිසාත්, මූලික විනය නියෝගය ඉවත් කරමින් අභියාචනා නියෝගය මගින් චූදිත සේවකයින් සියළු චෝදනාවලින් නිදහස් කර ඇති නිසාත්, වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන තර්කය පදනම් විරහිත වන බවට නිගමනය කරමි. ඒ අනුව චූදිත සේවකයින් අභියාචනා නියෝගය මගින් සම්පූර්ණයෙන් නිදොස් වූ පුද්ගලයින් බව යථාවත් වී ඇති බැවින් ඔවුන්ට විනය ව්‍යවස්ථා මාලාවේ 6-1 වගන්තිය යටතේ සේවය තහනම්ව සිටි කාලයට පසු වේතන ලබා ගැනීමට හිමිකම් ඇති බවට නිගමනය කරමි.

ඒ අනුව චූදිත සේවකයින්ට හිමි විය යුතු සහන මොනවාදැයි බලමු.

කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.07.15 වැනි දින මා වෙත යොමු කර ඇති පාර්ශ්වකරුවන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ 2007.04.12 වැනි දින සිට වැඩ තහනම් කරනු ලැබූ ආර්. එම්. එන්. රාජපක්ෂ හා එන්. ජී. ප්‍රේමසිරි යන අය සම්බන්ධයෙන් 2007.11.23 වැනි දිනැති අභියාචනා නියෝගය ප්‍රකාරව ඔවුන්ගේ **වැඩ තහනම් කර තිබූ කාල සීමාව සඳහා හිඟ වේතන ලබා නොදීම** සම්බන්ධයෙන් සොයා බැලීමයි.

ඉහත සඳහන් චූදිත සේවකයින් දෙදෙනාවම 2007.04.12 වැනි දින සිට සේවය තහනමට ලක් කර විනය පරීක්ෂණ පවත්වා 2007.08.02 වැනි දින විනය නියෝගය නිකුත් කර ඇත. එකී විනය නියෝගය අනුව දඬුවම් නියම කර ඇත. ඉන් පසුව පාර්ශ්වකරුවන් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එසේ නමුත්, සේවය තහනම්ව සිටි කාලය විනය නියෝගය නිකුත් කිරීමෙන් අවසන් වී ඇත. පාර්ශ්වකරුවන් විසින් ද වෙනත් සහන සම්බන්ධයෙන් වෙන් වශයෙන් ඉල්ලීම් කර නැත.

ඒ අනුව මෙම සේවකයින් දෙදෙනාගේ සේවය තහනම්ව සිටි කාලය වනුයේ 2007.04.12 වැනි දින සිට 2007.08.02 වැනි දින වන අතර, ඒ අනුව එක් එක් සේවකයා සේවා තහනමට ලක් වී සිටි කාලය වන්නේ මාස 03 යි, දින 20 ක කාලයකි.

ඒ අනුව ආර්. එම්. එන්. රාජපක්ෂ යන අයට මාස 03 යි, දින 20 ක් ද, එන්. ජී. ප්‍රේමසිරි යන අයට මාස 03 යි, දින 20 ක කාලයක් සඳහා වැටුපක් වැඩ තහනම් කර තිබූ කාල සීමාව සඳහා ලබා දිය යුතු බවට නිගමනය කරමි.

මෙම නඩුවේදී පාර්ශ්වකරුවන්ගේ වැටුප් සම්බන්ධ විස්තර ඉදිරිපත් කර නොතිබූ හෙයින් පාර්ශ්වකරුවන්ට නොතිසි කරන ලදුව 2014 මාර්තු මස 14 වැනි දිනෙන් යුතුව ශ්‍රී ලංගම කන්තලේ ඩිපෝව මගින් නිකුත් කරන ලද ලේඛන දෙකක් මගින් එක් එක් සේවකයා සම්බන්ධ වැටුප් විස්තර ඉදිරිපත් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංගම විසින් ලබා දෙන ලද එකී ලේඛනවල සඳහන් මාසික වැටුප් ගණනය කිරීම සඳහා යොදා ගෙන ඇත. ආර්. එම්. එන්. රාජපක්ෂ සම්බන්ධයෙන් රු. 25,913.00 ක් ද, එන්. ජී. ප්‍රේමසිරිට රු. 28,306.25 ක් ද සඳහන් කර ඇත.

ඒ අනුව ආර්. එම්. එන්. රාජපක්ෂ යන අයට (රු. 25,913.00 x 03 දින 20) = රු. 86,376.66 (අසූහය දහස් තුන්සිය හැත්තෑ හයයි ශත හැට හය) ක මුදලක් හිමි විය යුතු බවට ද,

ප්‍රේමසිරි යන අයට (රු. 28,306.25 x 03 දින 20) = රු. 94,354.08 (අනූහතර දහස් තුන්සිය පනස් හතරයි ශත අට) ක මුදලක් ද හිමි විය යුතු බවට ද මෙයින් නියෝග කරනු ලැබේ.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද දින සිට දින 30 ක් ඉක්ම යාමට ප්‍රථම එහි සඳහන් මුදල වෙන් වෙන් වශයෙන් එක් එක් සේවකයා වෙනුවෙන් කොළඹ 05, නාරාහේන්පිට, කම්කරු මහලේකම් කාර්යාලයේ, නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාල භාර සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කල යුතුය.

මෙම ප්‍රදානය යුක්තිසහගත හා සාධාරණ ප්‍රදානයක් බව නිගමනය කරමි.

එන්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු.

2014.07.24

09 - 530

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.